
# නිර්මාණ Nirmana



**අප පත්‍රයට පාසැල්වියේ සිටම පද්‍ය රචනාකරන දුලාංජලී සිරිවර්ධන කිවිදියගේ දයාබර මෑණියන් මේ නොබෝදා අභාවප්‍රාප්ත වූවා ය. පවුලේ එකම දරුවා වන දුලාංජලීට සිය මවගේ වියෝගය දැනෙන අන්දම මෙසේ ලියා එවා ඇත. සිරිවර්ධන මහත්මියට නිවන් සුව පතමු !**

## වියෝවූ අම්මාට......

දොරකඩ දුරුතු පිණි බිඳු ඇද හැලෙන පැයේ
නොනිවෙන සෝ සුසුම් දුකඳුරු තබා ළයේ
තෙරපුණු කඳුළු කැටි නෙතගින් ඉවත නොයේ
මව් ගුණ සුවඳ අහිමිය මට තුරුණු වියේ

සෙනෙහස් දියෙන් දියතම තෙත් කළ තාලේ
රතු ලේ කිරට හරවා මට පෙවු බාලේ
මගෙ සෙවනැල්ල මෙන් පසුපස සිටි කාලේ
සිහිවී සිත හඬයි ඉල්ලා මුදු ආලේ

සුදු වැලිතලාවට හිරු රැස් වැටෙන විට
සුදු හුණු බිත්ති කිරි පැහැයෙන් දිලෙන විට
සුදු මල් පඳුරෙ මල් සුළඟට සැලෙන විට
සුදු අම්මගේ සෙනෙහස ඇඳුනයි දුරට

මවු සුදු මඳහසක් මතකෙට නැං වෙනවා
කළුවර ගලන විට තනිකම වැඩි වෙනවා
දුවකට එකම සම්පත අහිමිව යනවා
නිවසේ මැණික් ආලෝකය බොඳ වෙනවා

නොකලට පරව ගිය අරලිය මලක් මෙනේ
පරවුණු මා කුසුම! සැම නෙත කඳුළු ගෙනේ
සුළඟක දැවටිලා නිම් නැති සිසිල කිනේ
සිහිනෙන් ඇවිත් මා හිස පිරිමදිනු මැනේ!

♦ **දුලාංජලී සිරිවර්ධන**
**නීති පීඨය (අවසන් වසර)**
**කොළඹ විශ්වවිද්‍යාලය Sri lanka**

## ආදරය

ආදරයයි ලොවේ ඇති මහඟුම බලය
පිහිටා තිබේ ඒ මත මුලු ලෝ තලය
දියදම ආදරය උතුරා යන විලය
උරුමය අප සැමට එහි අගනා ඵලය

කිතු හිමි මෙන්ම බුදු සමිඳුගෙ බල මහිමේ
පදනම ආදරෙයි එය මෙතෙකැයි නොනිමේ
පියවර එවන් ආදරයක මුල පිරුමේ
ආදර කිරීමයි තමනට හැකි තරමේ

ආදරයක් නැතොත් තමහට කිසි විටක
අන් කිසිවෙකුට ආදරයක් කළ නොහැක
සීමාරහිත ආදරයෙන් පිරි දිනක
සිතකට කෙලෙස් මුල් සිඳ බුදු වනු ඇහැක

බුදු බව කියන්නේ ආදරයයි පරම
අපරිමිතය නිම් හිම් නැත එහි තරම
පිහිටා තිබේ ඒ මත මුලු බුදු දහම
එය කිසි තැනක නොව ඇත්තේ අප තුළම

හාරා බලන විට හැම සිතකම පතුළ
ආදරයක්ය ඇත්තේ අන්තෙට පතළ
කිසිවක් මෙලොව නැත ඒ දහමට ඉහළ
කළ හැක එයට හැම සව් ඉසුරුම පහළ

♦ **මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**

## තරු එළිය

සුපුන් සඳ හිනැහුනත් අහස කළුවර බිබී
විටින් විට තරු එළිය නිවි නිවී දිලි දලී
යම්තමින් හෝ එළිය ඇතැයි ඉඟි බිහි පපා
ඒ තරුම හිනැහේවි නෙතට දසුනක් වෙලා

නොපායා ඇති නමුත් සුපුන් සඳ සිත් අහස
නිවි නිවී දිලෙන තරු පිවිතුරුය සිත්කළුය
ඒ එළිය තුළ සිටින මගෙ සිතට දෙන සහන
සුපුන්සඳ නැති වුනත් දැනෙන සුව අපමණය

ඈත සිට කළුවරේ බලන කා හට වුවද
තරු පොකුරු හිනාවෙන හැටි හරිම සුන්දරය
උරුම නැති මුත් සඳක් මගේ සිත් අහසටම
සතුටුවෙමි තරු එළියෙ හිනැහෙමින් පීනන්න

♦ **ජයසේන සේනානායක** **Sri Lanka**

## Cleaning

Temporary workers
Work in the garden
Slash withered stems
Gather fallen petals

Need to make it nice
For new comers

They don't see the blood
Pouring out
All the way down to the earth

They weren't the ones who
Planted the seeds

I want to clean my heart
As the way they do
Pull out the old memories
To let new happiness to grow

Roots in my veins
Scents of my past
I can't pull them off
Till its gardener last

♦ **Sriya Kumarasinghe**
***Dunedin-New Zealand***

## යටගියාව

**සීතලට වකුටු වී කොහේ හෝ**
**මගේ අතීතය සබඳ**
**මම මවාගන්නම්**

**පැතූ හැම පැතුම් මල්**
**ඵල දරා ගත් අයුරු**
**සිත කියූ වග ලොවට**
**හඬ නගා කියන්නම්**

**වංකගිරි නෑ ලොවේ**
**ගල් බොරළු නෑ මගේ**
**සිතෙන අයුරින් පෙනෙන**
**සදෙව් ලොව අතීතේ**

**පසුතැවිලි නෑ වුණේ**
**වැරදුමක් වෙද කෙසේ**
**සක්සුදක් සේ සිතමි**
**මැවී එන අතීතේ**

♦ ***Dr* විකුම්ප්‍රිය පෙරේරා**
**USA**

## අපි ජනපති සමගයි !

බිය සැක නැතිව රටතුළ නිති ඇවිදින් න
තැන තැන ගොසින් සිතු පැතු දේ කරගන් න
බසයක නැගිලා ගොස් සතුටින් ගෙට එන් න
දුන් නිදහස ඇතිය හොඳටම සැහෙන් න

රස මසවුලෙන් පිරි කැමත් අපට එපා
රට තුළ තිබෙන හැම සම්පත් අපට එපා
අහසේ උසට මිළ මුදලුත් අපට එපා
ගෙන දුන් නිදහසය හොඳටම වේය සැපා

බොරු ගොත ගොතා මඩ ගැහුවත් කමක් නැහැ
අපි කිසි විටෙක ඒවට රැවටෙන්නෙ නැහැ
වටිනා ඡන්දෙ මුදලට විකුණන්නෙ නැහැ
ඉර හඳ තිබෙන තුරු ඔබ පරදින්නෙ නැහැ

♦ ***එස්. කංකානම්ගේ***
**London SE 5**



**නපුරු වී උදම්..... ඇයිද මේ තරම්..... සිතට දී රිදුම්.....?**

රෝස මල් කොපුල් - නා දල්ල සේ දෙතොල්
නීල නෙත් උපුල් - සනසන්න මසිත දුහුල්
දෑත පාමිනා - පෙම් රැල්ල මුව නගා
මගෙ දිවිය හිමි කියා - පැමිණි සුරතලී ඔයා
දැන් ඇයිද මේ තරම් - ඔබ නපුරු වී උදම්
මගෙ සිතට දී රිදුම් - නෙත ඉකිබිඳින තරම්
ආ මගේ මෙතෙක් - තෙපලූ පැතුම් වදන්
වළලන්න සිත් සැදූ - ඔබ කොහෙද රත්තරන්
ඇයිද ඒ තරම් - වෙනස් වෙන්නටම තරම්
කළ වරද මෙමන් -දැන්වත් මට කියනු ඉතින්
එන්න මා ළඟින් - පෙර දා වගේම දැන්
මහ මනින්න පෙම් - පියවර දිවියෙ නමින්

මාලපල්ලේ
♦ ***කුමුදු රොහාන් අමරසිංහ***
**Edmonton - London**

## ස්වර්ණ ජයන්තිය

නෑ මිතුරන්ට පෙන්වා සෙනෙහසක අගේ
ලෝකෙට සෙතක් කර ගිලෙමින් සතුටු ගඟේ
පැතුම ඉටුවුණා හිමියනි ඔබේ මගේ
මිහිරියි යුග දිවිය තාමත් එදා වගේ

පෝරුව මත අප දෙදෙනා සිටින විට
යළි ඉපදුණා සේ දැනුණා සෙනෙහෙ පිට
අවුරුදු ගණන් කල් හෙමිහිට ගෙවෙන විට
දිවියම කැපවුණා හද පිරි සෙනෙ හසට

තනිකම අපේ ජීවිතයෙන් තුරන් කර
දරු මුනුබුරන් පිරිලා ඇත අපෙ ගෙදර
සුන්දර මතකයන් ගැන සිහිකර නිතර
හිනැහෙමු අපි නිබඳ සැනසුම තුරුළු කර

අඩසිය වසක් ගෙවුණා එක් වෙලා අපී
විඳි දුක් සුසුම් කිසිවක් මට මතක නැතී
උණුසුම ඔබේ රැකවරණය ලැබුව හැටී
එදා වගෙයි අදටත් අඩුවෙලා නැතී

මුවපිරි සුහදවත් ඔබෙ සිනහව තාම
ගිලිහී නොමැත රසවත් වෙයි හැම දාම
පවුලේ දියුණුවට ඔබගේ කැප වීම
හිමියනි ඔබයි ජීවිතයේ සැන සීම

♦ ***කුමාරි විජේරත්න***
**Hounslow Middx UK**

## Musings of a Lady

In the looking glass I see
a stranger looking back at me
Father time has taken his toll
humility, anger, frustration . . . old
why does my mind keep saying ..young
I am nineteen . . . twenty one
youth and vitality in my soul
I deride what I behold
Be the best that I can be
I will not let life conquer me
I have traversed countless seas
mountains and shores
there can be nothing more
eyes behold beauty in man and beast
adapted culture from the east
youth and age let us abide
chalk it to experience and pride.

♦ **Maria Reed-Shore**
**Houston USA**



***කුමාරතුංග මුනිදාස මහතා***

**මෙම දකුණු පස පැදි පෙළ අප රටේ විසූ ශ්‍රේෂ්ඨ පඬිරුවනක් වූ, හෙළ බසට අනුපමේය මෙහෙවරක් සිදු කළ, එමෙන්ම හෙළ හවුලේ නිර්මාතෘවර කුමාරතුංග මුනිදාස විද්වතුන්ගේ අභාවයෙන් 66 වසක් පිරීම නිමිත්තෙනි.**

## ගොඩනැගීම

ඉහළට ඉහළට හිස ඔසවනා
වේ දල්ල
සමගියේ අපූරු නිමැවුම
ඒ මැටි තුඹස
අසමගිය වපුරන
ණය වී ගොඩ නගන
යළි යළිත් බිඳදමන
දිවි ඇති තුරා
තනි තනිව වෙහෙසෙන
ලතවෙන, කිසිදා නිමා නොවන
මිනිසුන්ගෙ සිහින මන්දිර!

♦ ***වසන්තාකුමාරි දසනායක***
***කිරිඳිවැල Sri Lanka***




## කාන්තා දිනය

ඇරඹුණු දා පටන් මානව කතන් දරේ
ඔහු හා ඈ ගසයි වැල මෙනි ගමන් කරේ
ලස්සන කරන්නට ලෝකය නිරන් තරේ
හැකියාවක් රැඳී ඇත මාගමුන් කෙරේ

හිරුගේ උණුසුමෙන් මව්කිරි සිසිල මත
ලොව හැම දෙයම බිහිවී ඇත පැවත එත
වනිතා දිනය මව්පදවිය දරණ කත
නිසි පුද ලබන දිනයක් විය යුතුව ඇත

ලලනා ලාලිතය මත රණහස දේනූ
දෙමු ඉඩහසර හදකට කම්පිත සානූ
නොමනා දඩබ්බරකම් නොමැනවි පානූ
රකිතොත් රැකෙනු ඇත විළිබියකම ගෑණූ

මේ මගෙ බිරිඳ නැගණිය යෙහෙළිය අම්මා
සිතතොත් මහ තොටේ ආදර ඇස නම්මා
නවතී රුදුරු අතවර නෙක නැති නිම්මා
වේවා පහළ ඈ වෙත දිට්ටිය සම්මා

♦ ***නිමල් වසන්ත කුමාර***
**හෝකන්දර Sri Lanka**

## මුනිදසුන් සැමැරුම්

ලොවැ කිසි කලෙක නොපහළ අන් කිසි දෙසක
හෙළිකැර අනනතාවය උත්තම රැසක
ඉමැ දුටු වෙසරදාණන් ඉමියුරු බසෙක
සැමරුම යළි ඇවැමෙන් හැට හය වසෙක

මතු කොටැ යටගියාවෙහි කරුණු හෙළ බිම
බිබිඳැ විජයිඳුඳුන් මුල් කැරු වපුළ මත හැම
බලි තරු රවුළ් නරවිරුවනගෙ හොඳ නම
තුඩඬැ තුඩඬැ රැඳඳුඅයුරු නොරහසකි රට ටම

බස සාහිතය ගැන හෙළ පරපුරෙහි තුඟු
ඉසිවර දැනුම ලැබ සරසවි මුවග රැඟු
වෙසරද ඇදුරු මහ කිවියර කුමර තුඟු
විරුවෙකි නැණවතෙකි දිය දද දියත නැගු

අදිරද ගැති හැඟුම් හමුවෙහි නොවුණු නතු
දෙස බස රැස අපගෙ තෙරුවන පරිදි සිතු
සිරිලක් මැණියන්දැ පැතු පිනැති පුතු
මුනිවරයෙක්ය මහ පෑ පිරිවරට මතු

හෙළ බසටම උරුම මුත් පැවති අදිසි වැ
තැනදී ඇ කාරයටද නිතර වෙසෙසි වැ
නැතියෙන් කිසිත් කළ මහ මෙහෙය සදිසි වැ
අද ඇත නැවත මුනිදස් දැක්ම ඇවැසි වැ

♦ ***එච්. එල්. අමරසේකර***
**බද්දෙගම Sri Lanka**

## දියණියට !

ජීවන උයනෙ පිපි සුවඳැති මල් ගොන්න
දූගේ සිනාවෙන් තව ලස්සන වෙන්න
පහළොස් වියට පා තැබූ බව සිහි වන්න
පතනෙමි අසිරි ඔබෙ දිවි මග සරු වෙන්න

සැමදා සතුට සැනසුම ඔබ ළඟ වේවා
දුක් වේදනා ඔබෙ දිවියේ නොම වේවා
තබන තබන පා දියුණට ළං වේවා
දූ සඳමාලි සැම දෙවියන් රැක දේවා!

♦ ***අලගල්ලේ මැණිකේ වික්‍රමසිංහ***
**Jordan**